# ජිනවංසදීප මහා කාව්‍යයේ පළමු සර්ගයෙහි එන දුෂ්කර බන්ධන ශෛලිය පිළිබඳ විමසුමක්

**පහලගම ධම්මික හිමි**

## හැඳින්වීම

මහාකාව්‍ය උත්කර්ෂවත් සාහිත්‍යාංගයක් වශයෙන් සංස්කෘත සාහිත්‍යයෙහි ප්‍රසිද්ධියට පත් වී තිබේ. සංස්කෘත ආලංකාරිකයෝ මහාකාව්‍ය ලක්‍ෂණ කෙරෙහි බොහෝ රුචිකත්වයෙන් යුක්තව ක්‍රියා කොට තිබීම ඊට හේතුව විය හැකිය. දණ්ඩීන් ආදි ආලංකාරිකයන් මහාකව්‍ය ලක්‍ෂණ කෙරේ උනන්දුවක් දැක් වූහ. ඒ නිසා තත්කාලීනව හා පශ්චාත් කාලීනව සංස්කෘත මහාකාව්‍ය සාහිත්‍යය පුළුල් පරාශයක් කරා විහිදී ගිය බව පෙනෙයි. නමුත් පාලියේ දී මහාකාව්‍ය සාහිත්‍යය එතරම් දුරට ජනප්‍රිය වූයේ නැත. ඊට හේතු වන්නේ පාලි අලංකාර ශාස්ත්‍රයට ගුරූපදේශ සපයන්නා වූ කෘතිවල පවත්නා අඩුපාඩුකම් වශයෙන් සිතිය හැකිය. පාලි භාෂාවෙන් මහාකාව්‍ය රචනා වූවා නම් ඒ අල්ප ප්‍රමාණයකි. ඒ අතර බුද්ධ චරිතය තේමා කළ කෘති අතර අති දීර්ඝ කෘතියක් වශයෙන් **පාලි ජිනවංසදීප මහාකාව්‍ය** ප්‍රධානත්වයක් ගනී.


## කර්තෘ හා කාලය

**ජිනවංසදීප මහාකාව්‍යයේ** කර්තෘ වන්නේ මොරටුවේ මේධානන්ද හිමියන්ය. පානදුරේ වැලිපිටියේ අභයකරුණාරත්න මුදලින්දාරාමාධිපතිව වැඩ වාසය කළ කතු හිමියන් පිළිබඳව පොල්වත්තේ බුද්ධදත්ත හිමිගේ අදහස ''මේධානන්ද ස්ථවිරතුමා වනාහි ක්‍රි.ව, 1878 මොරටුවේ ඉපිද එකොළොස් හැවිරිදි කල මොරටුවේ ලක්‍ෂපතියේ ක්ෂේත්‍රාරාරාමාධිපති වැලිගම සංඝානන්ද මහ ස්ථවිරතුමන් වෙත රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙනේ ඉගෙනීම ලැබීමය. 1898 දී ලක්දිවට පැමිණි වජිරාරාමික මහතෙරුන් සමග බුරුම රටට ගිය එතුමා එහි දී උපසම්පදාව ලබා ඒ වජිරාරාමික මාහිමියන් වෙතින් ද කුමාරාභිවංස මහාධම්මරාජගුරු මාහිමියන් වෙතින්ද අභිධර්මය ඉගෙන ගෙන අවුරුදු සයකට පසු ලක්දිවට

පැමිණියේය. ඉන් නොයෙක් දිශාවන්හි ධර්මදේශනා පැවැත්වීමෙහිත් ග්‍රන්ථකරණයෙහිත් යෙදුණු මෙතුමා මේ පොත ලියා අවසන් කර තිබෙන්නේ තිස් අට විය ඇති කල්හිය'' **(බුද්ධදත්ත හිමි, 2012, 392).** වර්තමානයේ දක්නට ඇත්තා වූ ජිනවංසදීපය කොළඹ, විද්‍යාසාගර මුද්‍රණාලයෙන් 1917 දී මුද්‍රණය කොට තිබේ. පිටු 706 තරම් සුවිසල් ග්‍රන්ථයක් වේ. තිස් වන පරිච්ඡේදයේ 69 වන ගාථාවෙන් කර්තෘ පිළිබඳ ප්‍රකාශ වුවත් පළමු පරිච්ඡේදයේ ඇති දුෂ්කර බන්ධන රචනයේ දී කර්තෘනාම ගර්භ චක්‍රයක් දක්වා තිබේ. එය මෙසේය,

''මෙත්තාය ඡත්තං'ව ඵණං ඵණින්දො
ධාරෙසි සීසෙ වසිතො චචාර,
නථාමවා'කාව'බලෙසු කිඤ්චි
මෙධාය නන්දො ථිරවාචි බෙමෙ'' **(මේධානන්ද හිමි, 1917: 37).**

මෙම ගාථාවෙන් ප්‍රකාශ කරන්නේ සුමේධ තාපසතුමාගේ මෛත්‍රී චිත්තය නිසා නාගරාජයා පෙණය ඡත්‍රයක් සේ හිසෙහි දරන බවත් බලසම්පන්න සතුන් දුර්වල සතුන්ට කිසිදු විපතක් නොකළ බවත් ය. ස්ථිර වදන් ඇත්තෝ ප්‍රඥාවෙන් සතුටුව භය නැති ස්ථානවල හැසිරුණ බව දැක්වේ. 96 වැනි මෙම ගාථාව දෙස බැලූ බැල්ලමට මෙහි ගත් කතුවරයාගේ නම් දැක්වෙන බව නොපෙනේ. ඒ සඳහා ගාථාව 'කවීනාම ගබ්භ චක්කං' යන කර්තෘ නාම ගර්භ චක්‍රයට ගාථාවේ අක්ෂර යොදා බැලිය යුතු වෙයි.



**අන්තර්ගතය**

පරිච්ඡේද තිහක් තුළ ගාථා දෙදහසක් අන්තර්ගත වෙයි. සෑම ගාථාවක් සඳහා ම සන්නයක් සකස් කොට තිබේ. බුද්ධ චරිතය පද්‍ය මාධ්‍යයෙන් වර්ණනා කිරීමට කර්තෘවරයා බොහෝ ශ්‍රද්ධා චේතනාවෙන් යුක්තව කටයුතු සම්පාදනය කොට තිබේ. බුද්ධ චරිතය කථනය කිරීමට ආරම්භ කරන්නේ අමරාවතී නගර වර්ණනාවෙනි. ග්‍රන්ථය අවසන් කරන්නේ බුදුරදුන්ගේ ධාතු පරිනිර්වාණ පිළිබඳ තොරතුරු දැක්වීමෙන් පසුවයි. දීර්ඝ වශයෙන් බුද්ධ චරිතය ගෙනහැර දැක්වීමට කර්තෘවරයා උත්සුක වී තිබේ. පරිච්ඡේද සර්ග නාමයෙන් ග්‍රන්ථයෙහි දක්වා තිබේ.

පළමු සර්ගයට අයත් ගාථා සංඛ්‍යාව සියයකි. මෙම සර්ගයේ විශේෂත්වය වන්නේ දුෂ්කර බන්ධනයන්ගෙන් මෙම සර්ග බන්ධනය කොට තිබීමයි. මෙම සර්ගයේ තොරතුරු වශයෙන් ඇතුළත් වන්නේ ප්‍රථමයෙන් රත්නත්‍රය ප්‍රණාමය සිදු කරනු ලබයි. ඉන්පසු සරස්වත්‍යාංශනය, උපන්‍යාසය, අමරාවතී නගර වර්ණනය, සුමේධ තාපස කුමාරෝත්පත්තිය, නාමාරෝපණය, කුමාර ක්‍රීඩා සමය හා සුඛ සංවර්ධනය, විද්‍යා ඉගෙන ගැනීම, පඤ්චකාම සුඛය අනුභවය, භවය කෙරෙහි කලකිරීම, අයකැමියන්ගේ ක්‍රියාකලාප, වස්තු පරිත්‍යාග, තපෝ වනයට යාම්, තාපස පරිකාර, දෝෂ අනුස්මරණය, වෘක්ෂ මූල සේනාසනවලට යෑම, අභිඤ්ඤා හා සමාපත්තිය උපදවා ගැනීම, ආරණ්‍ය වාසය, හිමාල වර්ණාව ආදි ප්‍රවෘත්ති පළමු සර්ගයේ අන්තර්ගත වෙයි. පළමු සර්ගය බුද්ධ චරිතය කථනය කිරීමට ප්‍රවේශයක් ගෙන මහාකව්‍ය ආරම්භ කොට තිබේ.

**වෘත්ත ලක්ෂණ**

සංස්කෘත අලංකාර ශාස්ත්‍රයේ දී පද්‍ය කාව්‍ය කොටස් වශයෙන් කීපයකට බෙදා වෙන් කරනු ලබයි. පාලි පද්‍ය ගාථා නාමයෙන් හඳුන්වයි. ගාථාවක් වීම සඳහා සම්පූර්ණ විය යුතු කරුණු කීපයක් දක්නට ලැබෙයි.

''කිංසු නිදානං ගාථානං, කිංසු තාසං වියඤ්ජනං,

කිංසු සන්නිස්සිතා ගාථා, කිංසු ගාථානමාසයොති.

''ඡන්දො නිදානං ගාථානං, අක්ඛරා තාසං වියඤ්ජනං,

නාමසන්නිස්සිතා ගාථා, කවි ගාථානමාසයොති'' **(සංයුත්ත නිකාය i, 2006, 70).**

කවි සූත්‍ර පාඨයෙන් පැහැදිලිවන්නේ ගාථා නම් කවිත්වයයි. භාවපූර්ණ ප්‍රකාශනයයි. චමත්කාර ජනනය කරන්නා වූ වස්තු බීජයයි. අලංකාර ගද්‍ය හා පද්‍ය යන දෙයංශයෙහි ම යොදයි. මූලික වශයෙන් පාලි කාව්‍ය ගද්‍ය හා පද්‍ය වශයෙන් කොටස් දෙකකට බෙදෙයි.

කාව්‍ය නම් රසවත් වූ වාක්‍යයයි. ''වාක්‍යං රසාත්මකං කාව්‍යං'' **(ජීබානන්ද, 1965: 16).** සංස්කෘත ආලංකාරිකයන්ගේ ඉගැන්වීමට අනුව පද්‍ය කාව්‍ය කොටස් පහකට බෙදෙයි. ගද්‍යයෙන් තොර වූ කාව්‍ය විශේෂය පද්‍ය නම් වෙයි. එම පද්‍ය ඡන්දසින් බන්ධනය කොට තිබේ.

01. මුත්තක කාව්‍ය

02. යුග්මක කාව්‍ය

03. සන්දානිතක කාව්‍ය

04. කලාපක කාව්‍ය

05. කුලක කාව්‍ය

''ආද්‍යං සමාසරහිතං - වෘත්තභාගයුතං පරම්

අන්‍යද්දීර්ඝ සමාසාඪ්‍යං - තුර්යංචාල්පසමාසකම්''

ගාථාවල බන්ධනය තුළ ඡන්දස නිදානය නම් වෙයි. එයින් ප්‍රකාශ වන්නේ ගාථා බන්ධනය වන්නේ ඡන්දස තුළ බවයි. ඡන්දස් විසි හයක් ඡන්දස් ශාස්ත්‍රයෙහි උගන්වයි. එකී ඡන්දස්වල වෘත්ත බොහෝය. ජිනවංසදීප මහාකාව්‍යයේ පළමු සර්ගයේ ගාථා 100 ම වෘත්ත හතරකින් රචනා කොට තිබේ. 1 සිට 4 ගාථාව දක්වා වංශස්ථ වෘත්තයෙන් රචනා කොට තිබේ. ජගති ඡන්දසට අයත් වෘත්තයකි. වංසට්ඨ වෘත්තය සංස්කෘයෙහි වංශස්ථ යනුවෙන් හඳුන්වයි. මෙහි ගණ පිහිටීම වන්නේ තගණ දෙකක් හා ජගණයක් රගණයක්ය. ''වදන්ති වංසට්ඨමිදං ජතා ජරා'' **(ලංකානන්ද හිමි, 1949: 80).**

මෙහි ලඝු ගුරු වින්‍යාසය මෙසේය. UU-/UU-/-U-/U-U වශයෙනි. පස් වැනි ගාථාවේ 95 වැනි ගාථාව දක්වා උපජාතී වෘත්තය බන්ධනය කොට තිබේ. උපජාති වෘත්තය යනුවෙන් ඡන්දස් ශාස්ත්‍රයෙහි උගන්වන්නේ වෘත්ත දෙකක සමමිශ්‍රණයකි. එකී වෘත්ත දෙක නම් ඉන්ද්‍රවජ්‍රා හා උපේන්ද්‍රවජ්‍රා වෘත්තයන්ය. මෙම වෘත්ත දෙක ම ත්‍රිෂ්ටුභ් ඡන්දසට අයත් වෙයි. ඉන්ද්‍රවජ්‍රා වෘත්තය නම් ''ඉන්දාදිකා තා වජිරා ජගා ගො'' **(ලංකානන්ද හිමි, 1949: 80).** තගණ දෙකක් හා ජයගණයක් ද පාදාන්තයෙහි ගුරු අක්ෂර දෙකක් වෙයි. එහි ලඝු ගුරු වින්‍යාසය මෙසේය. UU-/UU-/-U-/UU උපේන්ද්‍රවජ්‍රා වෘත්තයෙ නම් ''උපාදිකා සාවජතා ජගා ගො'' **(ලංකානන්ද හිමි, 1949, 80 පිටුව).** එහි ජගණ තගණ නැවත ජගණ හා පාදාන්තයේ ගුරු දෙකකි. එහි ලඝු ගුරු වින්‍යාසය මෙසේය. -U-/UU-/-U-/UU ඉන්‍ද්‍රවජ්‍රා - උපේන්‍ද්‍රවජ්‍රා වෘත්තයන්හි ලක්ෂණ මිශ්‍ර කොට පාද සතර නිර්මාණය වේ නම් එය උපජාති වෘත්ත නමින් හඳුන්වයි. උපජාති වුත්තය පිළිබඳ වුත්තෝදය උගන්වන්නේ මෙසේය. මෙබඳු අදහසකි.

''අනන්තරොදීරිත ලක්ඛණා වෙ
පාදාවිමිස්සා උපජාතයො තා,
එවං කිරඤ්ඤා සුපිමිස්සිතාසු
වදන්ති ජාතිස්විදමෙව නාම'' **(ලංකානන්ද හිමි, 1949: 80).**

ඉන්ද්‍රවජ්‍රා හා උපේන්ද්‍රවජ්‍රා වෘත්තවල මිශ්‍ර වීම අවස්ථා 14 ක දී සිදු වන බැවින් උපජාති වෘත්තයේ ප්‍රභේද 14 කි. ප්‍රථම පාදයෙන් උපේන්‍ද්‍රවජ්‍රා ලක්ෂණනත් සෙසු පාද තුන ඉන්‍ද්‍රවජ්‍රා ලක්ෂණයෙනුත් බඳනා ලද්දේ ''කිර්ති උපජාති'' වෘත්තය යි. ආදි වශයෙන් සෙසු ඒවා ඒ ආකාරයෙන් මෙසේ දැක්විය හැකිය.

| අංකය | 1 පාදය | 2 පාදය | 3 පාදය | 4 පාදය | නම |
|---|---|---|---|---|---|
| 01 | උ | ඉ | ඉ | ඉ | කීර්ති |
| 02 | ඉ | උ | ඉ | ඉ | වාණී |

| | | | | | |
|---|---|---|---|---|---|
| 03 | උ | උ | ඉ | ඉ | මාලා |
| 04 | ඉ | ඉ | උ | ඉ | ශාලා |
| 05 | උ | ඉ | උ | ඉ | හංසී |
| 06 | ඉ | උ | උ | ඉ | මායා |
| 07 | උ | උ | උ | ඉ | ජායා |
| 08 | ඉ | ඉ | ඉ | උ | බාලා |
| 09 | උ | ඉ | ඉ | උ | ආර්ද්‍රා |
| 10 | ඉ | උ | ඉ | උ | භද්‍රා |
| 11 | උ | උ | ඉ | උ | ප්‍රේමා |
| 12 | ඉ | ඉ | උ | උ | රාමා |
| 13 | උ | ඉ | උ | උ | ඍද්ධි |
| 14 | ඉ | උ | උ | උ | බුද්ධි |

''ඉ'' යන්නෙන් ඉන්ද්‍රවජ්‍රා ද,''උ'' යන්නෙන් උපේන්ද්‍රවජ්‍රා ද හැඳින්වේ. **ජීවනංසදීප මහා කාව්‍යයේ** පළමු සර්ගයේ 5 වන ගාථාවේ සිට 96 වන ගාථාව දක්වා පද්‍ය බන්ධනය සඳහා භාවිත කොට ඇති උපජාති වෘත්ත මෙසේ හඳුනාගත හැකිය.

| **උපජාති වෘත්තය** | **ගාථා අංකය** |
|---|---|
| ආර්ද්‍රා | 6, 17, 22, 26, 41, 42, 87, 94, 95 |
| බුද්ධි | 7, 19, 20, 28, 56, 63, 66 |
| හංසි | 9, 40, 52, 65, 81, 89 |

| | |
|---|---|
| කීර්ති | 10, 12, 31, 32, 67, 80 |
| වාණී | 11, 25 |
| ජායා | 12, 21, 43, 45, 64 |
| රාමා | 15, 49, 6 |
| බාලා | 16, 24, 27, 38, 53, 70, 76, 84 |
| පෙමා | 29, 30, 34, 44, 68, 75 |
| මායා | 33, 46, 48, 50, 54, 59, 88 |
| ශාලා | 36, 37, 39, 55, 60, 61, 62, 79, 96 |
| භද්‍රා | 47, 57, 78, 85, 92, |
| මාලා | 41, 58, 72, 73, 74, 83 |
| ඍද්ධි | 71, 77, 82 |

සන්න සහිත ප්‍රබන්ධශිරෝමණී නම් ලද **ජිනවංසදීප මහාකාව්‍යය** 1917 විද්‍යා සාගර මුද්‍රණයේ වෘත්ත සංකේතය නම් 63 පිටුවේ 5 සිට 96 දක්වා උපජාති යනුවෙන් දක්වා ඇත. එනමුත් මෙම සර්ගයේ උපජාති පබැඳුම් අතර 8, 90, 91, 93 යන ගාථාව උපේන්ද්‍රවජ්‍රා වෘත්තයෙන් ද 51 වැනි ගාථාව ඉන්ද්‍රවජ්‍රා වෘත්තයෙන් රචනා කොට තිබෙයි. 97, 98, 99 ගාථා ප්‍රථ්‍යාවක්ත්‍රයෙන් බන්ධනය කොට තිබේ. 100 ගාථාව සක්කරී ඡන්දසෙන් බන්ධනය කොට තිබේ.

**දුෂ්කර බන්ධන**

පද්‍ය රචනයේ දී ඡන්දස් නිවැරදිව භාවිත කළ යුතුවා සේම අලංකාර ද භාවිත කළ යුත්තේ එසේය. එසේ නොවූ විට කාව්‍ය දෝෂ ඇති වෙයි. මෙම මහාකාව්‍යයෙහි දක්නට ඇති විශේෂත්වය වන්නේ පළමු සර්ගයේ දී කර්තෘවරයා දුෂ්කර බන්ධන යොදා පද්‍ය රචනා කොට තිබීමයි. 1, 2, 3, ගාථා තුනම අව්‍යපෙත චතුප්පාදාන්ත යමක

බන්ධයෙන් රචනා කොට තිබේ. ගාථා තුනේ ම පාදාන්ත පද දෙක එක හා සමානව බන්ධකය කොට තිබේ. ඒ අව්‍යපේත චතුප්පාදාන්ත යමකයේ ස්වභාවය වෙයි **(මේධානන්ද හිමි, 1917: 1-4)**. 89 ගාථා සොළක්ඛර භ්‍රමණ යමක බන්ධනයකි **(මේධානන්ද හිමි, 1917: 32)**.


| | | | | |
|---|---|---|---|---|
| වි | කා | ස | සො | ගන්ධක ගන්ධ ගන්ධී |
| කා | මං | ද | හා | පොරසසීතලො තං |
| ස | ද | ඵ | ස | ඕගං පවනො පවායී |
| සො | හා | ස | යං | හංසරුතා'නුබන්ධො |

මෙම ගාථාවෙහි පාද හතරෙහි ම පළමු අක්ෂර දාහසය හරහට සේ ම පහළට කියවිය හැකිය. 90 වැනි ගාථාව සමත්තපාදාභ්‍යාස මහා යමකයකි.

''කපීතනා'සොක තමාල නීපා
කපීතනා'සොක තමාල නීපා
කපීතනා'සොක තමාල නීපා
කපීතනා'සොක තමාල නීපා'' **(මේධානන්ද හිමි, 1917: 33)**.


එක සමාන පාද හතරක් ඇත්තේ මහා යමකයයි **(ප්‍රේමචන්ද්‍ර, 1862: 368)**. මෙම ගාථාවෙන් ප්‍රකාශ වන්නේ වෘක්ෂවල නම්ය. පළමු පාදය හා සමානව ඉතිරි පාද තුනත් බන්ධනය කොට තිබේ. අක්ෂර බන්ධනයෙන් පාද සමාන සේ පෙනුන ද එහි අර්ථය වෙනස්ය. පාද සතරෙහි අර්ථ මෙසේය. කපීත - ආම්‍රාත වෘක්ෂය, **(සෝරත හිමි, 2009: 93)**. ශිරීෂ වෘක්ෂය, අශ්වත්ථ වෘක්ෂය, **(සෝරත හිමි, 2009: 70)**. බිල්ව වෘක්ෂය, **(සෝරත හිමි, 2009: 460)**. අසොක - අශෝක **(ප්‍රනාන්දු, 1922: 21)**. (හෝපලු), වකුල වෘක්ෂය, කටුක වෘක්ෂය, පර්කටී වෘක්ෂය. තමාල - තමාල වෘක්ෂය, වරුණ වෘක්ෂය, කෘෂ්ණඛදිර වෘක්ෂය, තාම්බූල ලතා, නීපා - කදම්බ වෘක්ෂය, බන්ධූක වෘක්ෂය, පීත ශාල වෘක්ෂය, නිචුල වෘක්ෂය. යනුවෙන් එක පදයකට අර්ථ හතරක් වන

සේ යමක බන්ධනය කර තිබේ. මහායමකය හෙවත් සමත්තපාදභ්‍යාස යමකයෙහි ස්වරූපය මෙබඳුය. මෙම සර්ගයෙහි චිත්‍ර බන්ධන තුනක් තිබේ. ගොමුත්තිකා නම් ගවයාගේ මූත්‍රා යන්නයි. ගවයෙකු ගමන් කරමින් සිදු කරන මූත්‍රා කිරීමක චිත්‍රණයක් සේ ගාථා පාද කිය විය හැකි වන සේ බන්ධනය කරන්නේ ගොමුත්තිකා බන්ධනයයි. 92 වැනි ගාථාව අද්ධගොමුත්තිකා බන්ධනයකි.




''පුප්ඵාවලී කන්දල පාටකග්ගා
කලාපනී සා වනරාජිනීලා,
පපුඵාකුලී කන්දන පාටලක්ඛී
කලාපනීලා වර රාජිනීව'' **(මේධානන්ද හිමි, 1917: 34).**

මෙම ගාථාවේ පූර්වාර්ධයේ විෂම පාදයෙහි පළමු පාදය වූ තෙවැනි පාදයේ දෙවන අක්ෂර සිට අක්ෂරයක් හැර අක්ෂරයක් වන සේ කිය විය හැකිය. සම පාදයන්හි දෙවන පාදය සිවු වන පදයත් සමග කිය විය හැකිය. තුන පාදය එක පාදයත් හතර පාදය දෙවන පාදයත් සමග කිය විය හැකිය. මෙය අද්ධගෝමුත්තිකා බන්ධනය යනුවෙන් හඳුන්වයි.




''න තාසිරො මඤ්ජරිකාසුරම්භා

න තාසිරො පඤ්ජරිකා රම්මෙ,

වනෙ නිබද්ධං රමිතො විභාසි

විනෙය්‍ය බන්ධූරචිතො පභාරො'' (**මේධානන්ද හිමි, 1917: 35).**

93 ගාථාව පාදගෝමුත්තිකා බන්ධනයකි. පළමු හා දෙවන පාදයත් තෙවන හා සිව් වන පාදයත් ගෝමුත්තිකා බන්ධනයෙන් චිත්‍රණය වෙයි.




''රජොකිරන්තා' වනතා ලතාසුං

ලාජොකිරන්තා වනිතා නතාව,

ඛිජො අරඤ්ඤං වසිතා පිතාසො

ගජොතරන්තොව ලතා විතානං'' (**මේධානන්ද හිමි, 1917: 35).**

94 ගාථාව ආකුලජාල හෙවත් අවුල්දැලකි. දැලක ස්වරූපයට ගාථාවේ පාද කිය විය හැකිය. සංකීර්ණ ආකාරයෙන් ගාථා පාද කිය විය හැකි නිසා මෙම බන්ධනය ආකුලජාල නමින් හඳුන්වයි. 95 ගාථාව කබ්බනාම ගබ්භ චක්කයයි. කාව්‍යයෙහි නම මෙම ගාථාවේ සඟවා තිබේ. 'ජිනවංසදීපං' යනුවෙන් පෙන්නුම් කරන්නේ ගාථාව ගර්භ චක්‍රයෙහි දැමූ විටය.



''මතංගජින්දා න මසක්කරිංසු

පාදානි නත්වා පදීපධාමං,

පඤ්ඤාවධං පීනතපං එලෙහි

හිමද්දපාදෙ පරිසුත්තමං'' **(මේධානන්ද හිමි, 1917: 36).**

ගාථාව දෙස බැලූ විට එහි කාව්‍යයෙහි සංඥා නාමය කෙසේවත් දක්නට නො ලැබේ. නම විද්‍යමානවීමට නම් ගර්භ චක්‍රයෙහි ගාථාව දිගහැරිය යුතුයි. 97 ගාථද්ධවිසය පටිලොම යමකයකි **(ප්‍රේමචන්ද්‍ර, 1862: 372).** ගාථාවේ දෙවන පාදයේ අග සිට කියවන විට පළමු ගාථා පාදය නිර්මාණය වෙයි. පළමු පාදයේ අග සිට කියවන විට දෙවන පාදයේ මුල සිට නිර්මාණය වෙයි.

''නො'සිතෙහි'ස්ස සන්තාස'න්නූ'න තොස වතො යදා,

දායතො වසතො න'නුසන්තාස්ස හිතෙසිනො'' **(මේධානන්ද හිමි, 1917: 38).**

ඉන්පසුව ඇති ගාථාව සබ්බතො භද්ද යමකයකි. සියලු පැතිවලින් ගාථාව කිය විය හැකිය. දුෂ්කර බන්ධයෙහි අපහසු යමකයක් වශයෙන් මෙම යමකය සඳහන් කළ හැකිය.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යො | කා | ස | වා | වා | ස | කා | යො |
| කා | ම | කා | ම | ම | කා | ම | කා |
| ස | කා | ය | නා | නා | ය | කා | ස |
| වා | ම | නා | ග | ග | නා | ම | වා |
| වා | ම | නා | ග | ග | නා | ම | වා |
| ස | කා | ය | නා | නා | ය | කා | ස |
| කා | ම | කා | ම | ම | කා | ම | කා |
| යො | කා | ස | වා | වා | ස | කා | යො |

''යොකා'සවා'වාස කායො කාම'කාම'මකාම'කා,

සකායනා'නාය'කාස වාම නාග ගනා'මවා'' **(මේධානන්ද හිමි, 1917: 38).**

99 වැනි ගාථාව අද්ධබ්භම යමකයකි. සියලු දිශාවන්ට භ්‍රමණය නොවී හරස් අතට හා පහළට ගාථාව කියවිය හැකිය.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ද | යා | ය | ව | සි | නො | දා | යෙ |
| යා | ප | ජා | සි | ව | මා | ස | දා |
| ය | ජා | ර | හං | රං | ජ | මා | නො |
| ව | සි | හං | සො | චි | රං | ව | සි |
| සි | ව | රං | චි | සො | හං | සි | ව |
| නො | මා | ජ | රං | හං | ර | ජා | ය |
| දා | ස | මා | ව | සි | ජා | ප | යා |
| යෙ | දා | නො | ස | ව | ය | යා | ද |

''දයාය වසිනො දායෙ යාපජාසිව මාසදා,

යජාරහංරඤ්ජමානො වසිහංසො චිරංවසි'' **(මේධානන්ද හිමි, 1917: 39).**

මෙම සර්ගයේ අවසාන ගාථාව හෙවත් 100 වැනි ගාථාව පාදාන්ත යමකයකි. සිවු පාදයේ ම අවසාන පදය දෙවරක් යොදා තිබේ.

'' මධුමද මධුකර විරුතෙ විරුතෙ

මලයජ සුරබිත පවනෙ පවනෙ,

හිමවති විකසිත පදුමෙ පදුමෙ

අධිසුඛ මනුභවි සවසි සවසි'' **(මේධානන්ද හිමි, 1917: 39).**

අව්‍යපේත චතුප්පාදාන්ත යමකයකි. මෙහි සිවු පාදයේ ම අන්තයෙහි ඇති පද අව්‍යපේත වෙයි. සාමාන්‍යයෙන් යමක යන ශබ්දය යෙදෙන්නේ දෙක යන අර්ථය දීම සඳහා ය **(සුභූති හිමි, 1893: 293).** ශබ්දාලංකාරවල යමක යනුවෙන් අලංකාර විශේෂයක් දක්නට ලැබේ. විශ්වනාථයන් යමක යන්න මෙසේ පැහැදිලි කරයි.

''සත්‍යාර්ථෙ පෘථගාර්ථඃ ස්වරව්‍යඤ්ජනසංහතෙඃ,

ක්‍රමෙණ තෙනෛවාවෘත්තිර්යමකං විනිගද්‍යතෙ'' **(ජීබානන්ද, 1965: 479).**

දණ්ඩී ආචාර්යවරයා විශ්වනාථයන්ගේ අදහස මඳක් වෙනස් ස්වරූපයකින් දක්වා තිබෙන්නේ මෙසේය. ස්වරව්‍යඤ්ජන සමූහයේ ව්‍යවහිත අව්‍යහිත යම් පුනරුච්චාරණයක් වේ නම් ඒ යමකයි. පාදවල ආදි මධ්‍ය හා අන්ත වශයෙන් යමකයේ කොටස් වන්නේය.

''අව්‍යපෙතව්‍යපෙතාත්මා ව්‍යාවෘත්තිර්වර්ණසංහතෙඃ,

යමකං තච්ච පාදානාමාදිමධ්‍යාන්ත ගොචරම්'' **(ජීබානන්ද, 1965: 321).**

**පාලි ජිනවංසදීප** මහාකාව්‍යයේ පළමු සර්ගය ඡන්දෝ බන්ධනයෙන් පමණක් නොව දුෂ්කර බන්ධන, චිත්‍ර බන්ධන ආදිය

භාවිත කරමින් කර්තෘවරයා සිය දක්ෂතා කාව්‍යයට එක් කොටැති බව පෙනෙයි. කර්තෘවරයා සතු පාලි කාව්‍ය බන්ධනයෙහි ඇති තීක්ෂණ ඥාණය මෙම සර්ගයේ මනාව පිළිබිඹු වෙයි. සිංහල සාහිත්‍යයෙහි ජනාදරයට පත් වූ මහාකාව්‍ය වන්නේ කව්සිළුමිණ හෙවත් කුසදා කවයි. එහි නව වන පරිච්ඡේදය සිහිගන්වන ආකාරයට **ජිනවංසදීප** කර්තෘ පළමු සර්ගයේ පද්‍ය බන්ධනය සිදු කොට තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, **පාලි සාහිත්‍යය**, මරදාන, රත්න පොත් ප්‍රකාශකයෝ, හත් වන මුද්‍රණය, 2012. මෙම විස්තරය ජිනවංසදීපයේ තිස් වන පරිච්ඡේදයේ 61 සිට 70 දක්වා ගාථාවන්හි ඇතුළත් වෙයි.

මේධානන්ද හිමි, මොරටුවේ, **ජිනවංසදීප මහා කව්‍යය**, කොළඹ: විද්‍යාසාගර මුද්‍රණ, 1917, පි. 37.

**සංයුත්ත නිකාය i**, කවි සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. 2006.

විද්‍යාසාගර, ජිබානන්ද, **සාහිත්‍යදර්පණය**, චතුර්ථ සංස්කරණය, කල්කටා, 1965.

ලංකානන්ද හිමි, ලබුගම, ද්විතීය සංස්කරණය, **වුත්තෝදය**, 1949.

මේධානන්ද හිමි, මොරටුවේ, **ජිනවංසදීප මහාකව්‍යය**, කොළඹ, විද්‍යාසාගර මුද්‍රණ, 1917.

තර්කභාගීෂ, ප්‍රේමචන්ද්‍ර, **කාව්‍යාදර්ශයඃ ශ්‍රී දණ්ඩින්**, තෘතීය පරිච්ඡේදය, 70 ගාථාව, කල්කටා, 1862.

ආම්‍රාත - ඇඹරැල්ලා ගස, සෝරත හිමි, වැලිවිටියේ, **සංස්කෘතශබ්දාර්ණවය**, (ප්‍රථම භාගය) කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, නැවත මුද්‍රණය 2009.

අශ්වත්ථ - බෝගස, එම,

බිල්ව - බෙලි ගස, එම, පාලි බිල්ල, බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, **පාලි සිංහල අකාරාදිය**, කොළඹ, සී/ස ගුණසේන සමාගම, 2015.

හෝපලුගස, ජේම්ස් ප්‍රනාන්දු, ඩබ්ලිව්, **අමරශබ්දාවලී**, 1922.

මේධානන්ද හිමි, මොරටුවේ, **ජිනවංසදීප මහාකව්‍යය**, කොළඹ: විද්‍යාසාගර මුද්‍රණ, 1917, 92 ගාථාව.

තර්කභාගීෂ, ප්‍රේමචන්ද්‍ර, **කාව්‍යාදර්ශයඃ ශ්‍රී දණ්ඩීන්**, තෘතීය පරිච්ඡේදය, 75 ගාථාව, කල්කටා, 1862.

යමු උපරමෙ ණ්වු, යමකං, සුභූති හිමි, වස්කඩුවේ, **අභිධානප්පදීපිකාසූචි**, කොළඹ, රාජකීය මුද්‍රණාලය, 1893.

විද්‍යාසාගර, ජිබානන්ද, **සාහිත්‍යදර්පණය**, චතුර්ථ සංස්කරණය, කල්කටා, 1965, 10 පරිච්ඡේදය, 640 ශ්ලෝකය.

තර්කභාගීෂ, ප්‍රේමචන්ද්‍ර, **කාව්‍යාදර්ශය**, ශ්‍රී දණ්ඩීන්, තෘතීය පරිච්ඡේදය, 1 ගාථාව, කල්කටා, 1862.